ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය II කොටස

අවසාන පරීක්ෂණය 2006

ප්‍රාථමික තලය සඳහා සිංහල භාෂාව ඉගැන්වීම - **ESP 2468**

කාලය - පැය තුනයි (03)

---

දිනය : 2006.03.07 වේලාව : පෙ.ව.10.00 සිට ප.ව.01.00 දක්වා

---

ප්‍රශ්න <u>තුනකට *(03)* පමණක්</u> පිළිතුරු සපයන්න.
සෑම පිළිතුරක් සඳහාම වෙනම පොතක් භාවිතා කළ යුතුයි.

01. (i) පාසලේ ප්‍රාථමික පංතිවල ඉගෙනුම ලබන සිසුන්ට රචනා ලිවීමේ දී ක්‍රමික පුහුණුවක් ලබා දීම අවශ්‍යය." මේ පිළිබඳව ඔබගේ අදහස් නිදසුන් මගින් ඉදිරිපත් කරන්න.

(ii) ප්‍රාථමික පංතිවල සිසුන් විසින් ලියනු ලබන රචනාවක් රසවත්වීම කෙරෙහි බලපාන කරුණු පහක් (5) පැහැදිලි කරන්න.

(iii) ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් සිය රචනා රසවත් කර ගැනීම සඳහා ප්‍රාථමික සිසුන්ට ඔබ ක්‍රමවත් පුහුණුවක් ලබා දෙන්නේ කෙසේදැයි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

02. (i) "ප්‍රායෝගික ලේඛන" යනුවෙන් හඳුන්වන්නේ කවරේදැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ii) ප්‍රායෝගික ලේඛන සකස් කිරීමට ප්‍රාථමික පංතිවලදීම සිසුන් මෙහෙයවීමට උත්සාහ කිරීමේ ඇති වැදගත්කම විස්තර කරන්න.

(iii) එක් ප්‍රායෝගික ලේඛන වර්ගයක් නම් කොට තෝරාගත් ප්‍රාථමික පංතියක සිසුන් ලවා ඒවා ලිවීමට ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපායන් දක්වන්න.

03. (i) "සිංහලයේ යෙදුම්" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) සිංහලයේ යෙදුම් භාවිත කිරීමට හා දැනුම ලබා ගැනීමට ප්‍රාථමික පංතිවල සිසුන්ගේ අවධානය යොමු කරවීමට ඔබ ගන්නා පියවර හා ක්‍රමෝපායන් පැහැදිලි කරන්න.

(iii) ප්‍රාථමික පංතිවලදීම සිසුන් විසින් අවස්ථාවෝචිතව ප්‍රස්තාවපිරුළු යොදා ගැනීමට හුරුවීමේ ඇති වැදගත්කම නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

04. (i) ළමා කවි හා ගීත ලිවීමේදී ළමා සිතැඟි නිරූපණය කිරීමට උචිත බස් වහරක් උපයෝගී කර ගැනීම කවියාගේ මුඛ්‍ය පරමාර්ථය විය යුතුය." මේ කියමන ළමා කවි ලියූ කවීන්ගේ නිර්මාණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) "ළමා ලෝකය හා ළමා මනස පිළිබඳ අවබෝධයකින් යුතුව කවියා තම අත්දැකීම් ඉදිරිපත් කළ යුතුය." මෙබඳු අත්දැකීම් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපකාරී වන අන්දම ගැන ළමා කවි ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iii) ළමයින්ගේ සිත් සතන් ඇඳ බැඳ ගැනීමට ළමා කාව්‍යවල තිබිය යුතු විශේෂ ලක්ෂණ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

05. (i) ළමා කතා ලිවීමේ දී අවධානය යොමු කළ යුතු විශේෂ ලක්ෂණ පිළිබඳව නිදසුන් ඇසුරින් දක්වන්න.

(ii) ප්‍රාථමික අංශයේ සිසුන්ගේ භාෂාමය නිර්මාණයක ලක්ෂණ නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(iii) "ළමා සිතක සහෝදරයත්වය හා අන්‍යෝන්‍ය ආදරය පිළිබඳව මිහිරි සිතුවිලි තැන්පත් කළ යුතුවේ." "අයියයි, නංගියි" ළමා කතා පොත හෝ වෙනත් කතා පොතක් ඇසුරෙන් එම සඳහන පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

06. පහත සඳහන් ඕනෑම තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) කුඩා ළමුන් සඳහා උචිත පොත්පත් තෝරා ගැනීම

(ii) ළමා කවි හා ගීත ඇසුරෙන් නිර්මාණාත්මක කතන්දර ලිවීමේ වැදගත්කම

(iii) ළමා නාට්‍යයක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ හඳුනා ගැනීම

(iv) ළමුන් තුළ රස වින්දනය වර්ධනය කිරීම

(v) ළමා සිනමාව දියුණු කිරීමට ගත යුතු පියවර

- හිමිකම් ඇවිරිණි. -